දිවි තොර කරගැනීමක් යනු ගැටළුවක් සඳහා විසඳුමක් ලෙසින් සිදුකරනා පුද්ගලික තෝරාගැනීමක් නොවේ. දිවි තොර කරගැනීමක් පසුපස වඩාත් සංකීර්ණ කරුණු ගණනාවක් පවතී. දිවි අහිමි කරගත් පුද්ගලයාට දෝෂාරෝපණය නොකරමින්, ඒ පිළිබඳව සමාජය දැනුවත් කරමින් දිවි තොර කරගැනීම් වාර්තා කිරීම යෝග්‍ය යැයි මාධ්‍ය ආචාර ධර්ම පවසන්නේ ඒ හෙයිනි.

එසේ නම්,

1) දිවි තොර කරගැනීම "මෝඩ තීරණයක්" ලෙසින් දක්වමින්, දිවි තොර කරගත් අයට දෝෂාරෝපණය එල්ල කිරීම කෙතරම් ආචාර ධාර්මික යැයි ඔබ සිතන්නේ ද?

2) දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවක් හා හදිසි උපකාරක අංක පළ කරන්නේ නම්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති එක් අයෙකුගේ හෝ ජීවිතයක් බේරා ගැනීමට හැකියාව ලැබේ යැයි ඔබ නොසිතන්නේ ද? (මෙම පුවත්, එදින මෙම පුවත්පතේ සහෝදර ඉංග්‍රීසි පුවත්පත තුළ වාර්තා වී නොතිබුණි.)

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://save.org/.../preventing.../reporting-on-suicide